

**ගංගොඩවිල සාරානාත් බෞද්ධ මධ්‍යස්ථානයේ සමාධි බුද්ධ ප්‍රතිමා වහන්සේ**

## බුදුහිමි පෙන්වා දුන් මාතෘත්වයේ අගය

*– අලවතුපිටියේ පඤ්ඤාසීහ හිමි*

මාතෘත්වය පිළිබඳව බුදුවදන් තුළින් මතුකර ගත හැකි සුවිශේෂ කරුණු කිහිපයක් පිළිබඳ පාඨක විමසුම් ඇස යොමු කරවන මෙම ලේඛකයා – මවු පදවියේ සැබෑ වටිනාකම බුදුරදුන් පෙන්වා දී ඇති අයුරු – ඒ තුළින් හෙළිදරව් කරගැනීමට උත්සාහ දරයි.

## ශ්‍රේෂ්ඨ මිනිසකුවීමට බුදුරදුන් වදාළ මඟ

බොදු පිළිවෙත තුළින් සිත පිරිසුදු කරගැනීම – මිනිසාගේ සකල විධ ප්‍රගතියට හේතුවන නිවැරැදි හා නිරසාර මඟ බව ඒත්තු ගැන්වීමයි, ලේඛකයාගේ අරමුණ වන්නේ. ශ්‍රේෂ්ඨත්වයට පත්වීම සඳහා ඇති නොවරදින මාවත එය බවයි, ඔහු ඒ තුළින් පැවසීමට උත්සාහ කරන්නේ.

## අප පසුපස ගමන් කරන කුසල් - අකුසල්

*– ගලගෙදර රතනවංස හිමි*

බුදුදහම අනුව ලෞකික සැපත හා විමුක්ති සාධනය විෂයෙහි පුද්ගලයා සතුව ඇති ස්වච්ඡන්දතාවයෙහි විශිෂ්ටත්වය (පුද්ගල චර්යාවට හිමිවන වැදගත්කම) පිළිබඳ විග්‍රහයකි. සුප්‍රකට පිරිවෙනක ආචාර්යවරයකු වන හිමිනමකි, බුදුසරණට මෙම ලිපිය සපයන්නේ.

## බෞද්ධ දර්ශනය පිඬුකොට දැක්වූ දම්සක් පැවතුම් සූත්‍රය

*– නෙළුවාකන්දේ ඤාණානන්ද හිමි*

්‍ය‍‍ුදුදහමෙහි විශිෂ්ටත්වය පෙන්වන; එහි දර්ශන සාරය ඇතුළත් ආර්‍ය සත්‍ය සතර පිළිබඳ ඉගැන්වීම සඳහන් වූ 'ධම්ම චක්කප්පවත්තන සූත්‍රය' පිළිබඳ තරමක් ගැඹුරු විමර්ශනයකි. විශ්ව විද්‍යාල බාහිර කථිකාචාර්යවරයකු සහ පරිවෙණාධිපතිවරයකු වන සුප්‍රකට ලේඛක හිමිනමක් විසින් ඉදිරිපත් කරන ලද ලිපියකි.

## සිංහල භාෂාවේ ප්‍රගතියට බුදුසමයෙන් ලද ආලෝකය

*– ඩබ්ලිව්. කේ. උපසේන*

බුදු දහමේ ආභාෂය නිසා සිංහල සමාජය තුළ පැතිරුණු විවිධ වදන් ව්‍යවහාර සහ සාහිත්‍ය ග්‍රන්ථ නිර්මාණය – සිංහල භාෂාවේ පෝෂණයට බලපෑ අයුරු දැක්වීමට දරන ලද ප්‍රයත්නයකි, මෙම ලිපිය.

## වස්සාවාසික චීවර පූජාවේ ආධ්‍යාත්මික හරය

*– ගාමිණී රත්න ශ්‍රී*

වස් විසූ භික්ෂූන්වහන්සේ වෙත චීවර පිදීමේ ශාසනික පිළිවෙත තුළ ඇතුළත් ආධ්‍යාත්මික ප්‍රගතියට හේතුවන සාර දහම් පිළිබඳ විමර්ශනයක් හැටියට මෙම ලිපිය හැඳින්විය හැකිය. ලේඛකයා විශ්ව විද්‍යාල කථිකාචාර්යවරයෙකි.

## සදහම් දැනුම

*– වහුමුවේ විජයවංස නා හිමි*

බුදුදහම හා ඊට අදාළ විවිධ විෂය කරුණු පිළිබඳ කෙටි ප්‍රශ්න හා පිළිතුරු ඇතුළත් විශේෂාංගයෙන් ප්‍රයෝජනවත් වන මෙම විශේෂාංගය ඉදිරිපත් කරනු ලබන්නේ ප්‍රකට විද්වත් හිමිනමක් විසිනි.

## ශාස්තෘවරුන් අතර ශ්‍රේෂ්ඨතම ශාස්තෘවරයා බුදුරජාණන් වහන්සේ ම ය

බුදුරජාණන්වහන්සේගේ විශිෂ්ට ශාස්තෘත්වය තමන් දේශනා කළ පිළිවෙත පිළිබඳ චරිතාදර්ශය, විවිධ පුද්ගල චරිත වලට සරිලන ලෙස භාවිතා කළ සුවිශේෂ ඉගැන්වීම් ක්‍රම, ශ්‍රාවකයන් වෙත ලබාදී තිබූ විශිෂ්ට චින්තන නිදහස ආදී වූ ගුණය තුළින් පිළිබිඹු වන බුදුරදුන්ගේ ශ්‍රේෂ්ටත්වය අවධාරණය කිරීමටයි, මෙම විද්වත් ලේඛක හිමියන් උත්සාහ දරා ඇත්තේ.

## නිධානයක් පෙන්වන්නකු ඇසුරුකිරීම

*– දිවියාගහ යසස්සී නා හිමි*

මිනිස් ජීවිතය ඵලදායක කරන විවිධ වටිනාකම් හඳුන්වා දෙන බුද්ධිමතුන් ඇසුරු ඇසුරු කිරීමේ වැදගත්කම පෙන්වා දුන් ගාථා පාඨයකට සරල බසින් ඉදිරිපත් වූ අර්ථ විවරණයකි. සුප්‍රකට ධර්ම ලේඛකයකු විසින් ධම්මපද ගාථා අරුත් පැහැදිලි කෙරෙන විශේෂාංගයකට සපයන ලිපි පෙළක තවත් එක් ලිපියකි.

## සතුට හා සැපත උරුම ...

*– එස්. ඩබ්ලිව්. ගුණරත්න*

ධර්මය දැකීමෙන් නිවීමට පත්වූ සිතට හිමිවන සතුට හා සැනසීම පිළිබඳ සරල විග්‍රහයක් ඇතුළත් කෙටි ලිපියකි. වාණිජ පරමාර්ථ මුල්කොට ගත් අතිධාවනකාරී – තෘෂ්ණාභරිත නූතන සමාජයට දහම තුළින් නිවැරැදි ජීවන පිළිවෙත හඳුන්වාදීමට දරන ලද ප්‍රයත්නයකි.

## ගිරිඋල්ල පරණගම බැබිලවනාරාම ලෙන් විහාරය

*– දර්ශි කලුබෝවිල*

ඓතිහාසික දඹදෙණි යුගයට අයත් ඉපැරැණි විහාරස්ථානයක් පිළිබඳ තොරතුරුයි, මෙවර 'වෙහෙර විහාර' විශේෂාංගයට ඇතුළත් වන්නේ. ගල්ලෙන් තුළ ඉදිකොට ඇති මෙම විහාරයෙහි අලංකාර චිත්‍ර හා මූර්ති රැසක් ද තිබෙන බවයි, ලිපියෙන් පැවසෙන්නේ.

## Andhabhuta Jatakaya

*-by Dr.S.G. Samarasinghe Of Samskrti Research e-mail samskrti@sltnet.lk*

- **නිදහසින් පසු අන්‍යාගමිකයනටඅහිමිවූ අයිති-වාසිකම් මොනවාද?**

- Dialogues on Dhamma

  *-Andhabhuta Jatakaya -by Dr.S.G. Samarasinghe Of Samskrti Research e-mail samskrti@sltnet.lk*

- **'තිබ්බොටුවාවේ ශ්‍රී සුමංගල මහ නා හිමියන්ගේ පදවි ප්‍රාප්තිය මෑත කාලයේ ශ්‍රේෂ්ඨ සිදුවීමක්'**

  මල්වතු මහ නාහිමි පදවිය පිළිබඳ සන්නස් පත්‍රය පිළිගැන්වීමේ උළෙ-ලේදී ජනාධිපතිතුමිය කළ කතාව.